............පස් වන පිටුවෙන්

## ''පියවරක් ඉදිරියට.......

කර්තෘ මණ්ඩල ය එසේ ම තබාගැනීමට සටන් කළහ. ඔවුන් එසේ කළේ සැබැවින් ම සටන් කරන, පක්ෂයේ කව ස්වරූපය වෙනස් කරන, ක්‍රියාවට බහින පක්ෂ නායකත්වයක් ගොඩ නැගීම සඳහා ලෙනින් තුළ තිබූ තියුණු අධිෂ්ඨානය සම්මේලනය අතර තුරදී තේරුම් ගත් බැවිනි. කර්තෘ මණ්ඩලයත්, සංවිධායක කමිටුවත් පසුව පක්ෂයේ මධ්‍යම කාරක සභාවත් වෙනස් කිරීමට ලෙනින් කළ සටනේ දී මේ බව අනාවරණය විය.

මෙම වෙනස් කිරීම් වල තේරුම වන්නේ සෑම අකාරයේම ලිබරල්වාදීන් සමඟ පිහිටුවාගෙන තිබුණු පැරණි සම්බන්ධතාවයන් මුළුමණින්ම කඩා බිඳ දැමීමට බව ලෙනින්ගේ විරුද්ධවාදීන් දන සිටියහ. ඔවුන් ඉතා අප්‍රසන්න අරගලයක් මතු කරමින් ලෙනින්ට විරුද්ධව අති දුෂ්ඨ ප්‍රහාර එල්ල කිරීම දක්වා ඉදිරියට ආවේ මේ නිසා ය. අවසානයේ ලෙනින් ජයගත් විට අඩු සංඛ්‍යාව වූ විරුද්ධවාදීන් සම්මේලනයෙන් බැහැර වී ගියහ. මේ සියල්ල පිටුපස වූයේ කවයක් ලෙස පවතිනවා ද? පක්ෂය ගොඩනගනවා ද? යන ප්‍රශ්නය මත වූ මූලික ගැටුමයි. මේ කාලයේ දී ලෝකයේ සියලුම ප්‍රධාන රටවල් තුළ විප්ලවවාදී ප්‍රවනතා මතු වී ආවේ ය. ලෙනින් මෙන්ම ඒවාද තමන්ගේ ව්‍යාපාර තුළ තිබුණු සංශෝධනවාදී කණ්ඩායම්වලට එරෙහිව මාක්ස්වාදය සඳහා සටන් කරමින් සිටියෝ ය. නමුත් කෞට්ස්කි වැනි සංශෝධනවාදීන්ට විරුද්ධ ව තමන් කළ අරගලයන්ගේ අත්දැකීම් ඇතිව සිටි, ඇතැම් ප්‍රශ්න වලදී ලෙනින්ටත් වඩා තීක්ෂණ වූ රෝසා ලක්ෂම්බර්ග් වැනි අය මෙන්ම ට්‍රොට්ස්කි වැන්නවුන් පවා මේ සංශෝධනවාදී විරෝධී අරගලය, ව්‍යාපාරය තුළ සිටින්නන්ගේ භාවිතය සැබැවින්ම වෙනස් වන අයුරු පක්ෂයක් නිර්මාණය කිරීම සමඟ සම්බන්ධ නොකළාහු ය. ව්‍යාපාරයේ විප්ලවවාදී කොටසේ භාවිතය මාධ්‍යමිකයන්ගේ භාවිතයෙන් වෙනස් නොවී ය.

ඇත්ත වශයෙන්ම ඒ වන විටත් එය පොදු පත්‍රයකට ලිවීමේ, එක්තරා කථා ගණනක් පැවැත්වීමේ භාවිතයෙන් ගත් විට කිසියම් කටයුත්තක් ඉටු කිරීමේ භාවිතයක් විය. එය කම්කරු ව්‍යාපාරයේ එදිනෙදා වර්ධනය පිළිබඳ ගැටළු වලට මුහුණ දෙමින් එම ක්‍රියාදාමය තුළ උගැන්ම ලබමින් තම න්‍යායික පදනම් වර්ධනය කරන සජීවී පක්ෂයක භාවිතයක් නොවී ය.

මෙම සම්මේලනය තුළ දී ලෙනින් ගෙන ගිය අරගලය තුළින් අනාවරණය වූයේ සංවිධානය හා ඉදිරි දර්ශනය අතර තිබෙන නියම සබඳතාව යි. ඇත්ත වශයෙන්ම පක්ෂය ගොඩනැගීමේ, පක්ෂය ගත යුතු ස්වරූපයේ ප්‍රශ්නයට මුහුණ නොපාන තාක්කල් ක්‍රියාමාර්ගය මත ඇතිවන එකමුතුව ඇතුළතින් හිස් වූවකි. එවිට ක්‍රියාමාර්ගය පවතින්නේ ස්ථාවර, ආකාරගත, වියුක්ත දෙයක් වශයෙන් බැවිනි. ක්‍රියාමාර්ගය ස්ථාවර දෙයක් නොවිය යුතු ය. එය අඛණ්ඩ ලෙස විකාශනය වී යා යුතු අතර, තථ්‍ය අත්දැකීම් ඒ සමඟ ගටමින් වර්ධනය කළ යුතුය. ඒ නිසා ක්‍රියාමාර්ගය පක්ෂයෙන් හා සංවිධානාත්මක ප්‍රශ්නවලින් වෙන් කිරීම විඥානවාදයකි. මාක්ස්වාදය වර්ධනය වන්නේ පක්ෂය තුළ වියුක්තභාවයට එරෙහිව කරන අරගලයන් මගින් පමණි. මාක්ස්වාදීන් වශයෙන් වර්ධනය වන පුද්ගලයන් එසේ වන්නේ සංවිධානය තැනීමේ වගකීමට ඔවුන් විෂය බද්ධ ලෙස උර දෙන්නා වූ පමණට ය.

තම අරගලයේ දී ලෙනින් ඉදිරිපත් කළ දෙවන කරුණ වන්නේ පක්ෂය ගොඩ නැගීම කළ යුත්තේ ඉහළ සිට පහළට ද, නැතහොත් පහළ සිට ඉහළට ද යන ප්‍රශ්නය සම්බන්ධයෙන් විය. විවාදය ඇති වූයේ හුදෙක් කව සමූහයක් සංවිධානය කිරීමෙන් හා ඊට පසු දිගටම පළල් වීගෙන යන පහළ තට්ටුව මත පිහිටා තව තවත් කව හා වඩ වඩාත් ලොකු කව සංවිධානය කිරීමෙන් ඒවා පිරමීඩයක ආකාරයෙන් එකට සම්බන්ධ කිරීමෙන් ව්‍යාපාරයක් ගොඩනැගිය හැකි ද යන ප්‍රශ්නය උඩය.

එම විධික්‍රමයෙන් වෙන්විය යුතු යයි ද, පක්ෂයක් ගොඩ නැගිය හැක්කේ ඉහළ සිට පහළට පමණකැයි ද, ඉහළ විසින් පහළ තීරණය කළ යුතු යයි ද ලෙනින් කියා සිටියේ ය. එනම් ඉහළින් පවතින පක්ෂ සම්මේලනයේ සිට පහළ තිබෙන තනි තනි පක්ෂ සංවිධාන හා ශාඛා දක්වා පක්ෂය ගොඩනැගිය යුතු බව යි. සියලුම සාමාජිකයින් වෙත නිකුත් කරන ඉදිරි දර්ශන ලියවිලි පදනම් කරගෙන පක්ෂ ශාඛා වල කෙරෙන සාකච්ඡා වලින් පසු සමස්ථ සාමාජිකත්වය විසින් සම්මේලනයට නාමයෝජනා කරනු ලැබේ. මෙසේ බලන විට පක්ෂ සම්මේලනය පක්ෂය තුළ පවතින අනෙක් ඕනෑම මණ්ඩලයකින් වෙනස් ය. ප්‍රතිපත්ති පදනම් කොට සිතා මතා තෝරාගනු ලබන නිසා එය සමස්ථයක් වශයෙන් ගත් කල, පක්ෂ සාමාජිකත්වයෙන් පවා වෙනස් ය. එය පක්ෂ සාමාජිකත්වයට වඩා උත්තරීතරව ඉහළින් පවතී.

පක්ෂ සම්මේලනය කැඳවූ කල්හි පක්ෂ ශාඛාවල තව දුරටත් ව්‍යවස්ථානුකූල පැවැත්මක් නැත. එම තත්ත්වයේ දී ශාඛා ක්‍රියාත්මක වෙමින් පැවැතිය හැකි වුවත් පක්ෂයත් සම්මේලනයත් එකක් බවට පත් වෙයි.

පක්ෂ සම්මේලනය සැදුම් ලබන්නේ එසේ පත් කළ නියෝජිතයන්ගෙනි. එයට සහභාගී වීම සඳහා ඔවුන් ශාඛා වලින් නම් කරන්නේ අඩු කොටස් හෝ කණ්ඩායම් ද යනාදිය සමඟ කෙරෙන සාකච්ඡා පදනම් කොට ගෙන ය. එසේ වුවත් සම්මේලනය යනු ස්ථාවරයක් රැකීම සඳහා පවරණ ලද බලයෙන් යුතු නියෝජිතයන්ගේ මණ්ඩලයක් නොවේ. එනම් එක් ස්ථාවරයක් පදනම් කර නම් කර එවූ සහෝදරයකුට සම්මේලනයට සහභාගී වී එහි දී ඇතිවන දේශපාලන අරගලය පදනම් කරගෙන තම දේශපාලන ස්ථාවරය වෙනස් කිරීමේ හැකියාව, අයිතිය ඇත්තේ ය. අන් සෑම දෙයක් මෙන්ම සම්මේලනය ද පරස්පර විරෝධයන් අතරින් ඉදිරියට ගලා යන ක්‍රියාදාමයකි. අනතුරුව සම්මේලනයේ සාකච්ඡාවන් පදනම් කොටගෙන මධ්‍යමකාරක සභාවක් පත් කරයි. මෙසේ මධ්‍යම කාරක සභාව පක්ෂයේ අන් සියලුම මණ්ලයකින් වෙනස් වන අතර, ඉදිරි සම්මේලනය පැවැත්වෙන තුරු සියලු පක්ෂ මණ්ඩලයන් කෙරෙහි අධිකාරී බලය දරයි.

සැබැවින් ම පක්ෂය ගොඩනැගීමේ, එනම් පක්ෂයේ කේඩරයන් ගොනු කිරීමේ, පුහුණු කිරීමේ, යළි ගොනු කිරීමේ හා අන්‍ය කටයුතු වල වගකීම දරන්නේ පක්ෂයේ නායකත්වය යි. ව්‍යාපාරය මෙම පදනම මත, එනම් එහි ක්‍රියාකාරීත්වය, න්‍යායික අරගලය හා ඉදිරි දර්ශනය මත ගොඩ නොනැගුවහොත් එය පුද්ගලවාදයත්, විඥානවාදයත් පදනම් කර ගනිමින් ගොඩනැගෙන්නක් වන්නේය.

මධ්‍යගත වීම යනු එදිනෙදා කටයුතු හා අදහස් සම්බන්ධීකරණය කිරීම පමණක් නොවේ. එය තුළ යොමු කිරීමකුත් තිබේ. යොමු කිරීම තුළය සාකච්ඡාව ගමන් ගන්නේ. ඒ නිසා පක්ෂය තුළ සාකච්ඡා මතුවන්නේ ද මධ්‍යගතව යි. යොමු කිරීමට ගන්නා උත්සාහය නිරන්තරව පවතී. ඒ නිසාම කාර්යාලයට මධ්‍යගත කිරීම නොව, පුද්ගලයාට, දේශපාලන නායකත්වයට මධ්‍යගත කළ යුතුවේ. පොදුවේ සාකච්ඡාවට ගන්නා අදහස්වලට මග පෙන්වීමක් සැපයීම නායකත්වයේ කටයුත්තක් වේ.

"පටන් ගත යුත්තේ කොතැනින්ද?", "කළ යුත්තේ කුමක් ද?", හා "අඩියක් පෙරට අඩි දෙකක් පස්සට" යන මේ කෘති අපට තේරුම් ගත හැකි වන්නේ වර්තමානයෙහි අප පසුකරමින් සිටින වඩාත් සංකීර්ණ වර්ධනයන් තුළ සිට පමණකි. පක්ෂය ගොඩනැගීමේ අරගලයේ සැබෑ ලෙස යෙදෙන ප්‍රමාණයට පමණි. එමෙන්ම අප අද මුහුණ දෙන මූලික ප්‍රශ්න පිළිබඳව ලෙනින්ගේ කාලයේ දී කෙරුණු ඒ අරගලවල තතු න්‍යායිකව තේරුම්ගැනීමෙන් අප දැන් මුහුණ දෙන ප්‍රශ්න අපට ඉමහත් පැහැදිලිකමකින් යුතුව වටහා ගත හැකි වේ. ලෙනින් එකී තම අරගලයන් ගොඩනැගූ විප්ලවවාදී නායකත්වය නොවන්නට රුසියානු කම්කරු රජයක් බිහිවීම සිදු නොවන බව ගැන ඇති අපේ දැනුවත්කම තුළ ඒ දිසාවට අපි නැවත නැවතත් යොමු විය යුතුය.

# දෙමළ කොල්ලයට සම්බන්ධනුත් හවුල්



**අද මේ රජය උතුරේ යුද අනාථ කඳවුරු වල ඉන්න තරුණියෝ දකුණේ ජුකී කර්මාන්ත ශාලාකරුවන්ට භාර දෙනවා වැඩ පුහුණු කරවන්න කියල. තවත් අය අනාථ කඳවුරු තුළම විවාහ කරනව. රජයේ මේ වැඩපිළිවෙල ඔබ දකින්නේ කොහොමද?**

ආණ්ඩුව මේ වගේ වැඩක් කරන එක සම්පූර්ණයෙන්ම වැරදියි. ආණ්ඩුව කරන්න ඕනේ පළමුව ඒ අය නිදහස් කරන එකයි. සමහර විට අනාථ කඳවුරුවල කරන මේ ක්‍රියාකාරීත්වයන් විදේශ රටවලට පෙන්නල මුදල් ලබාගන්න කරන වැඩක් ද, කියලත් හිතෙනව. මම එහෙම කියන්නේ මීට පෙර පුංචි ළමයි පිරිසක් රත්මලානේ හිංදු කොලේජ් එකට ගෙනැවිත් උගන්වනව කියල ලෝකෙට පෙන්නල විශාල වශයෙන් විදේශීය මුදල් හොයාගෙන පසුව නිදහස් කළා. ඒ නිසා කසාද බඳිනව ද, ගාමන්ට්වල වැඩට යනව ද කියල ඒ ජනතාවට තීන්දු ගන්න සුදුසු නිදහස් වාතාවරණයක් හදන්න ඕනෑ පළමුව. ඒ සඳහා ඉක්මණින් ඒ අයව නිදහස් කළ යුතුව තිබෙනවා.

**මේ අතරෙ ව්‍යවස්ථාව වෙනස් කිරීම සම්බන්ධව දෙමළ ජාතික සංධානයේ නායක ආර්. නමුත් දෙමළ ජාතික සංධානය (TNA) ට තමයි මේ වෙලාවේ දෙමළ ජනතාව ඡන්දය දීල මහජන නියෝජිතයෝ ලෙස පත් කරගෙන තියෙන්නේ. එහෙනම් මේ වෙලාවේ ඒ නායකයන් කළ යුත්තේ මොකක් කියලද ඔබ යෝජනා කරන්නේ.**

ව්‍යවස්ථා වෙනසක් සඳහා සාකච්ඡා කරන්න කතා කරනවා නම් එයට යාම වැරදි නැහැ. හැබැයි ආණ්ඩුව කියනව නම් ඒකීය රාජ්‍ය තුළ තමයි විසඳුම දෙන්නේ කියල ඒ සාකච්ඡා වලට යෑම වැඩක් නෑ. ඒකට සහයෝගය දෙනව කියන එක වැරදියි. එක්සත් ලංකාවක් ඇතුලෙ ස්වපාලනය, ස්වයංතීරණ අයිතිය දිනාගන්න කතා නොකිරීම ම TNA නායකයන් කරපු බරපතල වරදක්. ආණ්ඩුවට යටත් වෙලා දෙන දේ ගන්න නම් සාකච්ඡා අවශ්‍ය නැහැනේ.

**ආණ්ඩුව එක්ක ඉන්න සමසමාජ, කොමියුනිස්ට් නායකයන් හා වාසුදේව වැනි අය ජනාධිපතිගෙ කාල සීමාව දීර්ඝ කිරීම පිළිබඳව විරෝධය පල කරල තියෙනව. මේක ඔබ දකින්නේ කොහොමද?**

මෙයාල හැමදාම මේ වගේ විරුද්ධ වෙවී ආණ්ඩුව ඇතුළේ ඇමතිකම් වරප්‍රසාද අරගෙන ඔහේ ඉන්නව. මේ විරෝධයත් ඒ වගේ එකක්. ඔය කට්ටියගෙ විරෝධය තියෙන්නේ මාධ්‍ය සාකච්ඡා තුළ පමණයි. ඕවා නිකම් ප්‍රදර්ශනාත්මක වැඩ. එයාල ඇත්තට ම විරුද්ධ නම් ඒවාට විරුද්ධව මහජනතාවත් එක්ක පාරට බැහැල ක්‍රියාකාරී විරෝධයක් පෙන්වන්න ඕන. එහෙම නොවෙනව නම් ඒවා මිනිසුන්ව රවටන බොරු රැවටිලිකාර වැඩ විතරයි. අඩුම තරමින් ආණ්ඩුව සේවකයන්ට දෙනව කියල පොරොන්දු වුණ රුපියල් 2500/= ගැනවත් මේ පක්ෂ කතා කරනවද? ආණ්ඩුවට බලපෑම් කරනවද වහාම ඒව දෙන්න කියල? ඒ නිසා මේ වගේ අය ගැන කතා කිරීමත් නිෂ්ඵල වැඩක්.

"මේ වන විට උතුරේ යුද අනාථ කඳවුරු තුළ සිටින ගැහැණු ළමයින් හමුදා මැදිහත්වීම මැද විවාහ කර දෙයි. පසුගියදා ජෝඩු 53 ක් එසේ විවාහ කැරිණි. ඊට අමතරව දකුණේ විවිධ කර්මාන්ත ශාලාවන්හි සේවය සඳහා මේ වන විට 550 ක් දෙනෙකු ගෙන ආ බව පලවිය. එහෙත් එම තරුණියන් BBC සංදේශය වැඩ සටහනක දී පවසා තිබුණේ රැකියා පුහුණුවක් පිළිබඳව සතුටක් ඇතත්, සැබෑ සතුට තිබෙන්නේ දෙමව්පියන් ළඟට යෑමට ලැබෙන්නේ නම් පමණි යන්න ය. යුද අනාථ කඳවුරු තුළ සිටින්නා වූ රැඳවියන් ගේ පෞද්ගලික කැමැත්ත මෙසේ ආණ්ඩුවේ තීන්දු තීරණයන්ට යටත් කරවීම "ප්‍රජාතන්ත්‍රවාදී" යයි කියන ආණ්ඩුවකට සුදුසු රාජකාරියක් ද? මේ ඒ පිළිබඳව හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.කේ. සිවාජිලිංගම් සමඟ කළ සංවාදයකි..."

වෙහෙසඃ
ඥාණසිරි කොත්තිගොඩ

**සම්බන්ධන් මන්ත්‍රීවරයත් එක්ක සාකච්ඡාවක් අරඹන්න ආණ්ඩුව තීන්දු කරල තියෙනව කියල ප්‍රකාශ වෙනව. මේ සාකච්ඡා පිළිබඳව ඔබේ ආකල්පය කුමක්ද?**

මේ තිබෙන ව්‍යවස්ථාව වෙනස් කරන්න ඕන කියල තමයි අපි ඔක්කොම කියන්නේ. ඒත් ආණ්ඩුව ඒ ස්ථාවරයේ නෑ. ජනාධිපති ධූරය තව දීර්ඝ කරගන්න පුළුවන්ද? වගේ එයාලගෙ වාසි සඳහා තමයි ව්‍යවස්ථා වෙනසක් සිදුකරන්න යන්නේ. උතුරු නැගෙනහිර වෙන් කරනව ය, 13 වැනි ව්‍යවස්ථා සංශෝධනය ට අදාලව ඒ පළාත්වලට ලැබිය යුතු පොලිස් බලතල, ඉඩම් බලතල දෙන්නේ නැහැ කියල ජනාධිපතිවරයා ප්‍රසිද්ධියේ ම කියල තියෙනව. ඉතිං එහෙව් රජයකට අපි සහයෝගය දෙනව කියල කියන එකේ තේරුමක් නෑ. ඒක වැරදියි කියලයි අපි කියන්නේ.

**ආණ්ඩුව ඉංදියාවත් එක්ක විවිධ ගිවිසුම් ගණනාවක් අත්සන් කරල තියෙනව. මෙකෙන් රටට යහපතක් වේවි ද?**

ඉංදියාව කලාපීය බලවතා ලෙස පිළි අරගෙන තමයි මේ ගිවිසුම් සියල්ල අත්සන් කරන්නේ. මේ ගිවිසුම් මොනවද කියල රටේ ජනතාව හරි හැටි දන්නේ නැහැ. ආණ්ඩුවේ මැති ඇමතිවරුවත් දන්නේ නැහැ. අන්තිමේදී මේ ගිවිසුම් හරහා ලංකාව ඉංදියාවේ කොළණියක් වෙන එක නම් ස්ථිරයි.

**ඉංදියාවේ කොළණියක් වෙනව නම් ඇයි ඒකට TNA නායකයෝ විරුද්ධ නොවෙන්නේ? එයාල ඒකට කැමති ද?**

ඉංදියාව කරන හොඳ දේ ත්, නරක දේ ත් හැම එකම හොඳ යි කියල පිළි ගන්න එක තමයි TNA නායක සම්බන්ධන්ගෙ ඉඳල ඒකෙ ඉන්න නායකයන් ඔක්කෝම කරන්නේ. මේක අන්තිම වැරදියි. දැන් බලන්න සාම්පූර්වල ජනතාව 2006 ඉඳල අනාථ කඳවුරුවලට ගාල් කරල. ඒ මිනිසුන්ගෙ ඉඩම් අක්කර එක්දහස් අටසියයක් ඉංදියාවට දීල, තාප බලාගාරයක් හදන්න. ඉතිං මේ අවුරුදු හතරක් තිස්සේ මෙහෙම ඉන්න යුද අනාථයන්ගේ ඉඩම් කොල්ලය ගැන සම්බන්ධන්ල මොනවද කරන්නේ? විරුද්ධව වචනයක්වත් කතා කරනව ද? නෑ. ඉන්දියාවට ඔළුව පහත් කරගෙන ඔහේ ඉන්නව.